කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

නීති පීඨය

නීතිවේදී උපාධි පරීක්ෂණය - තෙවන වසර - 2016/2017

# සාගර නීතිය

පැය තුනයි (3)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 07

ප්‍රශ්න හතරකට (4) පමණක් පිළිතුරු සපයන්න

(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ )

---

1. 'කිසිඳු රාජ්‍යයකට සාගරය ස්ථිරව සහ කාර්යක්ෂම ලෙස පාලනය කිරීමට නොහැකි බව අවධාරණය කරමින්, සාගාරයේ යම් ප්‍රදේශයකට හිමිකම් කීමට රාජ්‍යයකට අවසර දිය යුත්තේ එම සාගර ප්‍රදේශය පාලනය කිරීමට හැකි ප්‍රමාණය දක්වා පමණක් බව ග්‍රෝෂස් විසින් ප්‍රකාශ කර ඇත. ග්‍රෝෂ්ස්ගේ මෙම තර්කය පසුව සාගර නීතියේ එක් කුළුනක් බවට පත් වූවද, එය දාහත්වෙනි සියවසේ තරම් අද දවසේ පිළිගත හැකිදැයි සැකයක් මතුවිය හැකිය. තවද, අතීතයේ බලවත් රාජ්‍යයන් විසින් ඒකපාර්ශවීය හිමිකම් ප්‍රකාශ කිරීම මෙන් නොව, අද දිනයේදී සාගර පාලනය බහුපාර්ශවීය අයුරින්, නිසි අන්තර්ජාතික ආයතනවල සහභාගීත්වයෙන් සිදුකෙරේ.'

   සාගර නීතියේ ඓතිහාසික විකාශනය, නූතන ප්‍රවණතා සහ අනාගත අපේක්ෂාවන් ඇසුරෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

2. 'දේශගුණික ජල තීරයේ නිදොස් තරණයේ අයිතියක් (right of innocent passage) තිබුනද, එය වෙනත් සාගර කලාපවලදී නැව්වලට ඇති නිදහස්ව තරණය කිරීමේ (freedom of navigation) අයිතියට වඩා සීමිත වූ අයිතියකි.'

   එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (UNCLOS, 1982) යටතේ ඇති අයිතිවාසිකම්, නිදහස් හා වගකීම් ඇසුරෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. අදාළ උදාහරණ සහ අධිකාරීන් මඟින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

3. 2015 දී ඕසස්තාන් රාජ්‍යයේ අගෝරා විශ්වවිද්‍යාලයට තම මහාද්වීපික තටක ප්‍රදේශයේ සාගර ජීවීන් අධ්‍යයනය කිරීමේ ව්‍යාපෘතියකට මෙනාරා නම් රාජ්‍යයේ රජය විසින් අවසරය ලබා දුන්නේය. එම අවසරය දී තිබුනේ, අගෝරා විසින් තම පර්යේෂණ වල

සොයාගැනීම් මෙනාරා සෙන්ට්‍රල් විශ්වවිද්‍යාලය සමඟ බෙදාගැනීමේ කොන්දේසිය මතය. එනමුත් පර්යේෂණ වල සොයාගැනීම් කිසිවක් මෙනාරා සෙන්ට්‍රල් විශ්වවිද්‍යාලය සමඟ බෙදාගෙන නැති බවත්, මහාද්වීපික තටක ප්‍රදේශයේ ඛනිජද්‍රව්‍ය සඳහා මිනුම් ගැනීම් සහ විදීම් කර ඇති බවත්, 2017 අගෝස්තු මාසයේදී හෙළිදරව් වේ. තවද, පර්යේෂන සඳහා අවශ්‍ය යැයි කියමින්, අගෝරා විශ්වවිද්‍යාලය මගින් මත්ස්‍යයන්, ඩොල්ෆින් සහ තල්මසුන් ඇතුළු සාගර ජීවීන් මරා රැගෙන ගොස් ඇති බවත් පෙනී යයි.

මෙම තත්වය පිළිබඳව යම්කිසි අදාළ අන්තර්ජාතික නීතීන් ඇත්දැයි සහ ඒ සම්බන්ධව කිසියම් නීතිමය පියවරක් ගතහැකිදැයි දැනගැනීමට මෙනාරා රජයට අවශ්‍ය වී තිබේ. මෙනාරා රජයට උපදෙස් දෙන්න.

4. වසර 50ක කාලයකට සීලන් රාජ්‍යයේ සාගර පරිසර දූෂණ ව්‍යවස්ථා සංශෝධනය කර නැති හෙයින්, සීලන් රජය මගින් එම නීති යාවත්කාලීන කිරීමට තීරණය කර ඇත. සීලන් රාජ්‍යය විසින් මෑතකදී එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතිය (UNCLOS, 1982) ඇතුළු සාගර පරිසර දූෂණය සම්බන්ධව ඇති වඩාත් වැදගත් අන්තර්ජාතික සම්මුතීන් සියල්ලම අපරානුමත කර ඇත.

සාගර පරිසර දූෂණ නීති ප්‍රතිසංස්කරණය පිළිබඳ කමිටුවේ සභාපති ලෙස ඔබව නම් කර ඇතයි උපකල්පනය කරන්න. තම අන්තර්ජාතික වගකීම් වලට අනුකූලවීම සඳහා සීලන් විසින් ගත යුතු ප්‍රධානතම ප්‍රතිපත්තිමය සහ ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ පිළිබඳව මූලික වාර්තාව ඔබ විසින් සකස් කල යුතුය. එම මූලික වාර්තාව ඉදිරිපත් කරන්න.

5. <u>අ. හෝ ආ.</u> සඳහා පිළිතුරු සපයන්න

<u>අ.</u> 'සාගර පතුලේ ජෛව විවිධත්වය ආරක්ෂා කරන අතරම පෘතුවියේ මෙම ඉතා දුරස්ථ ප්‍රදේශය කාර්මීකරණ ක්‍රියාවලියකට යටත්කරගෙන පාලනය කිරීම ඉතා අභියෝගාත්මක කාර්යයක් වේ. තවද, පෞද්ගලික වාණිජ උවමනා සහ දේශීය ආර්ථික උවමනා ද, තම ජනතාව විසින් ප්‍රකාශ කර ඇති පාරිසරික සංරක්ෂණය පිළිබඳ අවධානයන්ද එකිනෙක හා තුලනය කිරීමට රාජ්‍යයන්ට සිදුවී ඇත.'

අදාළ නෛතික ප්‍රදේශය සම්බන්ධව ඇති අන්තර්ජාතික නීතිය, අන්තර්ජාතික පාලන රාමුව, වගකිවයුතු සංවිධාන සහ මෑතකදී සිදුවී ඇති වර්ධනයන්ද ඇසුරෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

ආ. 'කිසිඳු රාජ්‍යයකට බලාධිකාරියක් නොමැති, අන්තර්ජාතික බල සබඳතා බොහෝවිට විරුද්ධතා සහ එදිරිවාදිකම් වලින් යුතු වූ, පොදු ගෝලීය (global commons) ප්‍රදේශයක, සහයෝගීතාවයකින් යුතුව එකට වැඩ කිරීම රාජ්‍යයන්ට අභියෝගයක් වේ'.

මහ මුහුද හා සම්බන්ධ අන්තර්ජාතික නීතිය නිර්මාණය කිරීම සහ/හෝ ක්‍රියාත්මක කිරීම අවශ්‍යවන, රාජ්‍යයන් සහයෝගයෙන් විසඳිය යුතු වර්තමාන ගැටළු අවම වශයෙන් තුනක්වත් ගෙන හැර දක්වමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

6. 'එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතියට (UNCLOS, 1982) අනුව මහාද්වීපික තටක සීමා නිර්ණය කිරීම ඉතා සංකීර්ණ ක්‍රියවලියකි. මෙනිසා විවිධ රාජ්‍යයන්ගේ මහාද්වීපික තටක හිමිකම් කීම් සහ අයිතිවසිකම් පැහැදිලි කිරීම් සම්බන්ධව රාජ්‍යයන්ට භාවිතා කළ හැකි ආරවුල් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණයන් මගින් වැදගත් කාර්යභාරයක් සිදුකෙරේ.'

මෑතකදී මහාද්වීපික තටක ප්‍රදේශවලට රාජ්‍යයන් විසින් කර ඇති හිමිකම් කීම් ඇසුරෙන් ඉහත ප්‍රකාශය පිළිබඳව ඔබේ අදහස් දක්වන්න

7. කැලියා සාගරයේ අප්‍රසිද්ධ ප්‍රදේශයක පිහිටා ඇති 'ස්ටොනී' ලෙස නම් කර ඇති කුඩා ජනශූන්‍ය පර්වතය, මීටර් 25ක් පළල, මීටර් 30ක් උසවූ, ඈත අතීතයේ තිබූ ගිණි කන්දක ශේෂයකි. 'ස්ටොනී' පිහිටා ඇත්තේ ස්කොටියා රාජ්‍යයේ සිට නාවික සැතපුම් 150ක් බටහිරටත්, ඒරියා රාජ්‍යයේ සිට නාවික සැතපුම් 230ක් වයඹ ප්‍රදේශට වන්නට ය. මෑතකදී ස්කොටියා රාජ්‍යයේ නාවික හමුදාව 'ස්ටොනී' මතට ගොඩ බැස, ස්කොටියා කොඩිය එහි ඔසවා, එහි එක පැත්තක සිහිවටන පලකයක් සිමෙන්තියෙන් ඉදිකර ඇත. තවද ස්කොටියා විසින් තම සිතියම් වෙනස් කර, 'ස්ටොනී' වටා නාවික සැතපුම් 200ක ප්‍රදේශයක් ස්කොටියා ධීවර යාත්‍රා සඳහා පමණක් වෙන්කරගෙන ඇත. එම ප්‍රදේශයට ඒරියා කොඩිය සහිත ධීවර යාත්‍රා ඇතුල්වූ අවස්ථාවලදී එම යාත්‍රා ස්කොටියා නාවික හමුදාව විසින් අත් අඩංගුවට ගෙන ඇත. 'ස්ටොනී' අවට ඇති මුහුදු පතුලේ ඛනිජ හා වායු සොයමින් විදීම් කිරීමට ස්කොටියා සූදානම් වන අතර, ස්කොටියා නාවික හමුදාව විසින් ස්ටොනීවලට නාවික සැතපුම් 100ක් බටහිරෙන් මුහුදු පතුලෙයි මිනුම් ගැනීමට පැමිණි ඒරියාවට අයත් විද්‍යාත්මක පර්යේෂණ යාත්‍රා ආපසු හරවා යවා ඇත. ස්කොටියාවේ ක්‍රියාකලාපයන් සහ හිමිකම් කීම් අන්තර්ජාතික නීතියට පටහැනි වන බව ඒරියා කියා සිටී.

ඒරියා රාජ්‍යයට උපදෙස් දෙන්න.

*******